# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1796/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 03/12/2024<br>පැය 1410 |

**ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි බුද්ධික මනතුංග මහතා පොලිස් මාධ්‍ය ප්‍රකාශක ධූරයට පත්කරයි.**



ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි නීතිවේදී බුද්ධික මනතුංග මහතා ජාතික පොලිස් කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි වැඩ බලන පොලිස්පතිතුමා විසින් 2024.12.02 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පොලිස් මාධ්‍ය කොට්ඨාසයේ අධ්‍යක්ෂ හා පොලිස් මාධ්‍ය ප්‍රකාශක ධූරයට පත් කර ඇත.

එතුමා, 2014.01.01 වන දින සහකාර පොලිස් අධිකාරිවරයෙකු වශයෙන් ශ්‍රී ලංකා පොලිස් සේවයට ඇතුළත්ව 2020.01.01 වන දින පොලිස් අධිකාරි තනතුරටද, 2024.01.01 වන දින ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි තනතුරටද උසස්වීම් ලබා ඇත.

ඒ මහතා, මහනුවර, ත්‍රිකුණාමලය යන කොට්ඨාසවල රාජකාරි යෙදීමෙන් පසු මානව හිමිකම් කොට්ඨාසයේ අධ්‍යක්ෂ, පොලිස් මාධ්‍ය කොට්ඨාසය හා මහජන සම්බන්ධතා කොට්ඨාසයේ

වැඩ බලන අධ්‍යක්ෂ, නීති කොට්ඨාසයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ හා කන්තලේ කොට්ඨාස භාර නිලධාරී ලෙස රාජකාරි ඉටු කර ඇත.

කොළඹ ආනන්ද විද්‍යාලයේ ආදී ශිෂ්‍යයෙකු වන එතුමා පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ විද්‍යාවේදී පළමු උපාධිය හා විද්‍යාව පිළිබඳව පශ්චාත් උපාධිධාරියෙකු වන අතර විවෘත විශ්ව විද්‍යාලයේ නීතිවේදී උපාධිධාරියෙකුද වේ.

එතුමා, පොලිස් සේවයට සම්බන්ධ දේශීය පුහුණු පාඨමාලාවන්ට අමතරව රුසියාව, තායිලන්තය, පිලිපීනය හා කාම්බෝජියාව යන රටවල විදේශීය පුහුණු පාඨමාලාවන් රැසක් හදාරා ඇත.

එතුමා සම්බන්ධ කර ගත හැකි දුරකථන අංකයන් පසුව යොමු කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටින අතර, නව පොලිස් මාධ්‍ය ප්‍රකාශකතුමාගේ ඡායාරූපයක් මේ සමඟ ඔබ වෙත යොමු කරමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**